**ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2015**
**----------------------------------------------**

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
------------------------------------------------------------

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වනවිටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම
----------------------------------------------------

මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම්, පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම
-----------------------------------

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙළ කරන ලද 2014 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **වත්කම්** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 2,197,604,850 |
| ජංගම වත්කම් | 613,783,717 |
| මුළු වත්කම් | 2,811,388,567 |

| | |
|---|---|
| බැරකම් | |
| ජංගම බැරකම් | 2,167,051,875 |
| ජංගම නොවන බැරකම් | 1,093,267,215 |
| මුළු බැරකම් | 3,260,319,090 |
| ශුද්ධ වත්කම් / අයිතිය | (448,930,523) |
| මුළු බැරකම් | 2,811,388,567 |
| | |
| මුළු ආදයම | 1,040,811,290 |
| මුළු වියදම | 1,209,653,957 |
| ඌනතාවය | 168,842,667 |

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති,රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත - 18 වගන්තිය | 2012 අගෝස්තු මාසයෙන් පසුව මණ්ඩලයේ ස්ථිර තනතුරක් වූ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ස්ථිර පත්කිරීමක් සිදුකිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 10 වන වගන්තිය | ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු හා විධායක අධ්‍යක්ෂවරයකු පත් කිරීම සඳහා පනතේ විධිවිධාන සලස්වා නොතිබියදී එම තනතුරු සඳහා අධ්‍යක්ෂවරු පත්කර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. 1,738,083 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/2015 දරන චක්‍රලේඛයේ 3.5 ඡේදය | සාමාන්‍යාධිකාරීවරයා වෙත අනුමත ඉන්ධන සීමාව ඉක්මවා අනුමැතියකින් තොරව අතිරේක ඉන්ධන ලීටර් 1182 ක් සඳහා රු.112,290 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඈ) | 2004 ජනවාරි 08 දිනැති අංක 21 දරන චක්‍රලේඛය | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උත්සව වියදම් සඳහා රු. 131,079 ක් චක්‍රලේඛ නියමයන්ට පටහැනිව ගෙවා තිබුණි. |
| (ඉ) | 2008 මැයි 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 428 හා මුදල් රෙගුලාසි 371(2) | (i) භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත පමණක් සුළු මුදල් අග්‍රිම සීමාව රු.100,000 දක්වා වැඩි කර තිබුණි.<br>(ii) චක්‍රලේඛ ප්‍රකාරව සුළු මුදල් මගින් ගෙවිය හැකි උපරිම වටිනාකම රු.1,000 ක් වුවද, එම සීමාව ඉක්මවීමට අනුමැතිය ලබා ගැනීමකින් තොරව අවස්ථා 29 කදී රු. 85,227 ක් බිල්පත් පියවීම සඳහා ගෙවීම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2014 නොවැම්බර් 21 දිනැති කළමනාකරණ සේවා අංක 5/2014 දරන චක්‍රලේඛයේ 02 හා 3.2 ඡේද | අධ්‍යක්ෂ මණ්ඩලයේ හා මහා භාණ්ඩාගාරයේ එකගතාවය ලබා ගැනීමකින් තොරව රු.222,600 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. |
| (උ) | 1995 ජුලි 21 දිනැති ජනාධිපති ලේකම්ගේ SAI/A/4/34 දරන චක්‍රලේඛයේ 7 හා 11 ඡේද | විවෘත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව බෝපිටිය තේ කර්මාන්තශාලාව වර්ෂයකට රු. 1,200,000 බැගින් වර්ෂ 33 කට රජයේ තක්සේරු වාර්තා නොමැතිව බදු දී තිබුණි. |
| (ඌ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 136 හා 137 | සෑම ගනුදෙනුවක් සඳහාම වගකිව යුතු නිලධාරියෙකුගේ බලය දීමක් හා අනුමත කිරීමක් අවශ්‍ය වුවත් එසේ නොමැතිව අවස්ථා 11 ක දී වටිනාකම රු. 828,463 ක් වූ ගෙවීම් සිදුකර තිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

----------------

**3.1.1 තේ වගාව**

-------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ දෙකක නිම් තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය (COP) සාමාන්‍ය විකුණුම් වටිනාකම (NSA) හා දායකය පහත පරිදි වේ.

| වතුයායේ නම | නිෂ්පාදන පිරිවැය | | | සාමාන්‍ය වටිනාකම | | | විකුණුම් කිලෝ එකක දායකය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2014 | 2013 | 2015 | 2014 | 2013 | 2015 | 2014 | 2013 |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බෝපිටිය | 542 | 555 | 610 | 269 | 265 | 210 | (273) | (290) | (400) |
| බොහිල් | 614 | 473 | 582 | 236 | 254 | 261 | (378) | (219) | (321) |
| දෙල්තොට | 548 | 467 | 313 | 281 | 273 | 210 | (267) | (194) | (103) |
| ගලබොඩ | 599 | 550 | 614 | 252 | 271 | 265 | (347) | (279) | (349) |
| ග්‍රේට්වැලි | 743 | 632 | 637 | 269 | 326 | 211 | (474) | (306) | (426) |
| හන්තාන | 536 | 499 | 371 | 254 | 269 | 227 | (282) | (230) | (144) |
| හොප් | 481 | 508 | 390 | 290 | 403 | 589 | (191) | (105) | 199 |
| කන්දල්ඔය | 652 | 726 | 451 | 283 | 425 | 211 | (369) | (301) | (240) |
| කොළපතන | 383 | 358 | 350 | 249 | 267 | 255 | (134) | (91) | (95) |
| ලෙවලන් | 453 | 456 | 348 | 265 | 314 | 434 | (188) | (142) | 86 |
| ලූල්කඳුර | 404 | 406 | 325 | 274 | 321 | 460 | (130) | (85) | 135 |
| මහවිල | 468 | 483 | 287 | 253 | 255 | 267 | (215) | (228) | (20) |
| රහතුන්ගොඩ | 509 | 444 | 320 | 299 | 303 | 183 | (210) | (141) | (137) |
| රොක්වුඩ් | 415 | 377 | 325 | 293 | 278 | 203 | (122) | (99) | (122) |
| නාගස්තැන්න | 689 | 763 | 430 | 282 | 333 | 710 | (407) | (430) | 280 |
| ගලහ | - | - | 626 | - | - | 260 | - | - | (366) |
| මවුන්ට්ජීන් | 582 | 477 | - | 276 | 319 | - | (306) | (158) | - |

2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා තේ කිලෝග්රෑම් එකක නිෂ්පාදන පිරිවැය (COP), සාමාන්‍ය විකුණුම් වටිනාකම (NSA) හා ඒකක දායකය සැසඳීමේදී වතු 17 ක තේ කිලෝ ග්‍රෑම් එකක දායකය සෘණ අගයක් ගෙන තිබුණු අතර එය රු.20 සිට රු. 474 දක්වා වූ පරාසයක පැවතුණි. ඒ අනුව මණ්ඩලයේ නිෂ්පාදන ඒකකයක විකුණුම් ආදායමෙන් එහි පිරිවැය ආවරණය කරගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) තේ පර්යේෂණ ආයතනයේ ප්‍රමිතීන්ට අනුව මැදරට තේ හෙක්ටයාරයක සාමාන්‍ය නිමි තේ ඵලදාව කිලෝග්රෑම් .1200 ක් පමණ වන අතර මණ්ඩලයේ වතුයායන්හි හෙක්ටයාරයක සාමාන්‍ය නිමි තේ ඵලදාව සමාලෝචිත වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා පහත පරිදි විය.

| වතුයාය | වර්ෂය<br>2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ---------- | ------ | ------ | ------ | ------ | ------ | ------ | ------ | ------ | ------ | ------ |
| | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. |
| බෝපිටිය | 350 | 333 | 345 | 330 | 415 | 488 | 438 | 454 | 481 | 542 |
| බෝහිල් | 446 | 520 | 595 | 674 | 707 | 593 | 506 | 690 | 570 | 606 |
| දෙල්තොට | 342 | 332 | 435 | 453 | 428 | 480 | 481 | 605 | 574 | 571 |
| ගලහ | - | - | 274 | 198 | - | - | 234 | 333 | 302 | 266 |
| ගලබොඩ | 367 | 332 | 390 | 425 | 362 | 425 | 293 | 375 | 325 | 325 |
| ග්‍රේට්වැලි | 215 | 235 | 228 | 260 | 334 | 363 | 412 | 555 | 361 | 347 |
| හන්තාන | 344 | 342 | 441 | 325 | 387 | 355 | 356 | 489 | 475 | 512 |
| හෝප් | 552 | 592 | 667 | 672 | 557 | 693 | 645 | 728 | 578 | 659 |
| කන්දල්ඔය | 431 | 482 | 647 | 689 | 691 | 549 | 487 | 529 | 446 | 460 |
| කොළපතන | 684 | 805 | 963 | 1008 | 1016 | 939 | 750 | 956 | 706 | 782 |
| ලෙවලන් | 552 | 607 | 643 | 700 | 738 | 615 | 611 | 755 | 647 | 627 |
| ලූල්කඳුර | 674 | 645 | 739 | 830 | 697 | 800 | 736 | 1013 | 870 | 781 |
| මහවිල | 641 | 744 | 857 | 899 | 743 | 619 | 656 | 1024 | 839 | 793 |
| රහතුන්ගොඩ | 422 | 450 | 582 | 527 | 517 | 586 | 325 | 709 | 680 | 582 |
| රොක්වුඩ් | 510 | 593 | 612 | 622 | 575 | 668 | 580 | 666 | 550 | 501 |
| නාගස්තැන්න | 471 | 433 | 540 | 563 | 515 | 418 | - | - | - | - |
| මවුන්ට්ජීන් | 376 | - | - | - | - | - | - | - | - | - |

තේ පර්යේෂණ ආයතනයේ ප්‍රමිතීන්ට අනුව මැදරට තේ හෙක්ටයාරයකට සාමාන්‍ය ඵලදාව කිලෝග්රෑම් 1200 ක් වුවද 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම මණ්ඩලයේ වතුයායන් සියල්ලෙහිම ඵලදාව ඉතා පහල මට්ටමක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පොහොර අවශ්‍යතාවය අනුව වතු 16 ක් සඳහා ඇස්තමේන්තු ගත පොහොර වියදම රු. 43,936,405 ක් වුවද, පොහොර කිසිවක් මිලදී ගෙන නොතිබුණි. කාලීනව අවශ්‍ය පොහොර ප්‍රමාණය නොයෙදීම හේතුවෙන් මණ්ඩලයේ තේ දළුවල ගුණත්වය පහත වැටීම මත නිමි තේ සඳහා ඉල්ලුමද අඩුවීමේ අවදානමක් පැවතුණි .

(ඈ) වතුයායන්ට අදාල අයවැයගත අමු තේ දළු අස්වැන්න සත්‍ය අස්වැන්න සමඟ සසඳා පහත දැක්වේ.

| වතුයාය | අයවැයගත අමු දළු අස්වැන්න | සත්‍ය අමු දළු අස්වැන්න | අය වැය ගත ඉලක්කයන් කරා ළගා වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | % |
| බෝපිටිය | 282,600 | 157,400 | 56 |
| බෝහිල් | 450,000 | 43,217 | 10 |
| දෙල්තොට | 600,000 | 332,061 | 55 |
| ගලබොඩ | 329,500 | 211,407 | 64 |
| ග්‍රේට්වැලි | 272,600 | 152,203 | 55 |
| හන්තාන / ගලහ | 1,434,800 | 795,050 | 55 |
| හෝප් | 1,174,700 | 845,015 | 71 |
| කන්දල්ඔය | 473,100 | 258,388 | 54 |
| කොලපතන | 908,700 | 512,883 | 56 |
| ලෙවලන් | 2,476,000 | 1,422,223 | 57 |
| ලූල්කඳුර | 1,667,000 | 1,375,575 | 82 |
| මහවිල | 565,200 | 323,454 | 57 |
| නාගස්තැන්න | 348,000 | 240,578 | 69 |
| රහතුන්ගොඩ | 711,100 | 425,000 | 60 |
| රොක්වුඩ් | 1,030,800 | 745,394 | 72 |

මණ්ඩලයට අයත් වතුයායන් 15 න් වතුයායන් 9 ක අයවැය ගත නිෂ්පාදන ඉලක්කය වෙත ළඟාවීමේ ප්‍රතිශතය ඉතා අඩු මට්ටමක පැවති අතර එය සියයට 10 සිට සියයට 60 ත් අතර පරාසයක විය. අයවැයගත නිෂ්පාදනය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.1.2 **රබර් වගාව**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුමාරවත්ත වතුයායේ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 31.76 ක් වූ හෙක්ටයාර් 579 ක පමණක් රබර් වගා කර තිබූ අතර එම රබර් වගාවෙන් සියයට 70 ක් පමණ පරිණත රබර් ගස් විය. තවද මෙම පරිනත රබර් හෙක්ටයාර් ප්‍රමාණය තුල පැවතිය යුතු ඇස්තමේන්තු පැල ගණන 204,225 ක් වුවත්, පැවති පැල ගණන 102,375 ක් හෙවත් එනම් සියයට 50 ක් විය. සියයට 30 ක් වූ පරිණත නොවූ රබර් හෙක්ටයාර ප්‍රමාණය තුල පැවතිය යුතු ඇස්තමේන්තු පැල ගණන 85,165 වුවත්, පැවති පැල ගණන 62,004 හෙවත් සියයට 73 ක් විය.

(ආ) හෙක්ටයාරයකට ලැබෙන වියලි රබර්වල සාමාන්‍ය කිලෝග්‍රෑම් 1247 ක් වූවත්, 2014 වර්ෂයේ කුමාරවත්ත වතුයායේ වියලි රබර් ප්‍රමාණය කිලෝග්‍රෑම් 570 ක් හා සමාලෝචිත වර්ෂයේ පළමු මාස 06 තුළ කිලෝග්‍රෑම් 363 ක්වූ අඩු ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) කිරි කපනු ලබන ගස් ප්‍රමාණය හා විවිධ හේතු නිසා කිරි කැපිය නොහැකි ගස් ප්‍රමාණය වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණු බැවින් එක් එක් රබර් කට්ටියෙන් සාධාරණ කිරි ප්‍රමාණයක් ලබා ගන්නේද යන්න පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩම් බදු දීම

(i) මණ්ඩලය සතු දේපල 37 ක් බදු දීමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ නිරීක්ෂණය නොවූ අතර තක්සේරු වාර්තා ලබා ගැනීමකින් හා විවෘත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව බදු දී තිබුණි.

(ii) නියමිත බදු කාලය තුල මණ්ඩලය විසින් විධිමත් පරිදි ඉන්වොයිස්පත් බදුකරුවන් වෙත නිකුත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයයේදී වතුයායන් 20 කට අදාල අයවිය යුතු හිඟ බදු මුදල රු. 55,089,171 ක් විය.

(iii) වතුරුවිල වත්ත හා සොමිසඳ වත්ත යන දේපලවල බදු කාලසීමාව සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයෙන් අවසන් වුවද, මෙම බදු දේපල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් බදුකරුවන් විසින් පරිහරණය කල අතර මණ්ඩලය විසින් අදාල දේපල පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ පිහිටි ගබඩා සංකීර්ණයේ කොටස් දෙකක් 2013 සහ 2014 යන වර්ෂ වලදී බදු දී තිබු නමුත්, නියමිත බදු කාලය අවසානයේදී නැවත බදු දීමට හෝ දේපල පවරා නොගැනීම හේතුවෙන් බදුකරු විසින් එම දේපල අත්පත් කර ගැනීම සඳහා මණ්ඩලයට එරෙහිව නඩු පවරා තිබුණි. ආදායම් ඉපයීමකින් තොරව එම දේපල වෙනුවෙන් නඩු කටයුතු සඳහා රු. 180,000ක වියදම් දරා තිබුණි.

(ආ) සේවය අත්හිටුවා ඇති නිලධාරියෙකු විසින් තමන් පරිහරණය කරන ලද වාහනය රැගෙන ගොස් තිබූ අතර මාස 05 කට පසු වාහනය භාර දී තිබුණි. මේ සම්බන්ධයෙන් අදාල පරීක්ෂණ පවත්වා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) කුමාරවත්ත වතුයායට අයත් අක්කර 321 ක් පුද්ගලයින් 175 දෙනෙකු විසින් 1981 වසරේ සිට අනවසරයෙන් භුක්ති විඳින අතර 2009 වසරේදී මණ්ඩලය විසින් නෙරපීමේ නියෝග පුද්ගලයන් 11 දෙනෙකු වෙත ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 12 දින වන විටත් අදාල භූමියෙන් ඔවුන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් හා තක්සේරු වර්තාවක් ලබා නොගෙන වර්ෂයක කාලයක් සඳහා බදු දී තිබු කුමාරවත්ත වතුයායේ තේ අලෙවි සැලෙහි බදු කාලය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වුවද සමාලෝචිත වර්ෂය නොවැම්බර් 11 දින වන විටත් බදු කරු ඉවත් වී නොතිබුණු අතර ඒ දක්වා අයවිය යුතු හිඟ බදු මුදල් හා දඩ මුදල වූ රු. 1,360,000 අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විවිධ හේතූන් මත මණ්ඩලය විසින් සේවය අවසන් කළ නිලධාරියෙකු හා සේවකයකු මණ්ඩලයට එරෙහිව පවරන ලද නඩුවක තීන්දුව මගින් එම සේවකයන් වෙත ගෙවීමට නියෝග කර තිබූ වන්දි මුදල රු.1,364,934 ක් විය. අදාළ නඩු විභාගයේදී එම සේවකයින්ගේ සේවය අවසන් කිරීමට හේතු වූ කරුණු අධිකරණයේදී තහවුරු නොකිරීම හේතුවෙන් මණ්ඩලයට මෙම වන්දි මුදල ගෙවීමට සිදු වී තිබුණි.

**3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතු කර්මාන්තශාලා 13 ක් පවතින අතර ඉන් 07 ක් අක්‍රීය තත්ත්වයේ පවතින අතර කර්මාන්ත ශාලා 02 ක් බද්දු දී තිබුණි. නිමි තේ නිෂ්පාදනය සිදු වී තිබූණු ඉතිරි කර්මාන්තශාලා හතරෙහි මුළු නිෂ්පාදන ධාරිතාව දිනකට දළු කිලෝග්රෑම් 38000 ක් වූවද නිෂ්පාදනය සඳහා දිනක සාමාන්‍ය දළු ලැබීම කිලෝග්රෑම් 26,054 ක අඩු අගයක් විය. මෙසේ කර්මාන්තශාලා ඌන උපයෝජිතව ක්‍රියාත්මක වී තිබියදී සමාලෝචිත වර්ෂයේදී තේ දළු කිලෝග්රෑම් 1,227,226 ක් බාහිර පාර්ශවයන් වෙත අලෙවි කර තිබුණි.

(ආ) කුමාරවත්ත වතුයාය මගින් පවත්වාගෙන යන පරිගණකගත තොරතුරු පද්ධතියට අනුව 2015 ඔක්තෝබර් මාසයට අදාල වියළි රබර් කිරි නිෂ්පාදනය කිලෝග්රෑම් 12,497 ක්වූ අතර විගණකගේ ගණනය කිරීම අනුව එය කිලෝග්රෑම් 17,646 ක් වූයෙන් කිලෝග්රෑම් 5149 ක් අඩුවෙන් දක්වා තිබුණි. වියළි රබර් සංයුතියට අදාල සම්මත රේටයට වඩා අඩු අගයක් පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම හේතුවෙන් මෙසේ අඩුවෙන් දක්වා තිබූ අතර මේ හේතුවෙන් අක්‍රමිකතා ඇතිවීමට ඉඩ ප්‍රස්ථා ඇති වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) කුමාරවත්ත වතුයායේ විගණිත දිනයේදී ලබාගනු ලැබූ රබර් කිරි ප්‍රමාණය ලීටර් 794 ක් වූ අතර එදින එක් සේවකයෙකු විසින් එකතු කරන ලද කිරිවල සාමාන්‍යය ලීටර් 33 ක් විය. එසේ වුවද අනෙකුත් දිනයන්හිදී එම අගය ලීටර් 18 ක් වූයෙන් මෙසේ අඩුවීමට හේතු අනාවරණය කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගය ගෙන නොතිබුණි.

(ඈ) නිමි තේ තොග අලෙවි වූ මිල ගණන්වල සාමාන්‍ය හා තේ මණ්ඩලය විසින් මාසිකව නිකුත් කරනු ලබන කලාපයේ සාමාන්‍ය මිල සමඟ සැසඳීමේදී මණ්ඩලයේ නිමි තේ කිලෝවක් රු. 42.98 සිට රු. 153.08 අතර අවාසිදායක මිල විචලනයන් සහිතව අලෙවි වී තිබුණි. මේ අනුව කලාපයේ සාමාන්‍ය මිලට ළඟා වීමට හැකි වන පරිදි මණ්ඩලයේ නිමි තේ සුදුසු ගුණත්වයෙන් නොපැවතීම නිසා මාසයකට රු.11,112,740 ක පමණ ඇස්තමේනතුගත අලෙවි ආදායමක් අහිමි වී තිබුණි.

(ඉ) කුමාරවත්ත වතුයායේ හෙක්ටයාර් 16 ක පිහිටි උක් වගාව නියමිත කාලයේදී නෙලා නොගැනීමෙන් හා උක් ටොන් 13 ක ප්‍රමාණයක් ක්ෂේත්‍රයේ දිරා පත් වීමෙන් රු.2,160,000 ක ඇස්තමේන්තුගත අලාභයක් සමාලෝචිත වර්ෂයේදී සිදු වී තිබුණු අතර, 2013 වර්ෂයේදී හෙක්ටයාර් 04 ක වගාකරන ලද උක් වගාව අසාර්ථක වීමෙන් රු. 279,097 ක අලාභයක්ද සිදු වී තිබුණි.

**3.4 හඳුනාගත් පාඩු**

-------------------

අමු තේ දළු ගැනුම්කරුවකු විසින් මණ්ඩලයෙන් මිලදීගත් දළු වෙනුවෙන් තේ කොමසාරිස්වරයාගේ සාධාරණ මිලට වඩා අඩු මිලක් ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 766,110 ක පාඩුවක් සිදු වී තිබුණි.

## 3.5 සේවක මණ්ඩල පරිපාලනය

මණ්ඩලය විසින් වයස අවුරුදු 55න් විශ්‍රාම ගැන්වූ වතු අධිකාරීවරයකු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවක් මගින් විශ්‍රාම ගැන්වීම නීත්‍යානුකූල බවට තීන්දුවක් ලබා දී තිබියදී වර්ෂ 2 කට පසු එවකට සිටි සභාපතිවරයාගේ අභිමතය පරිදි වතු අධිකාරී තනතුර අවුරුදු 60 දක්වා දීර්ඝ කර මාස 8 කට පසු වැඩබලන සාමාන්‍යාධිකාරී ලෙස පත් කර තිබුණි. තවද 2013 ජනවාරි 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත තවත් මාස 06 කට සේවය දීර්ඝ කර තිබුණි. මේ අනුව නීතියට පටහැනිව සිදුකරන ලද මෙම පත්වීමට අදාළව ගෙවා තිබූ වැටුප් හා දීමනා වල එකතුව රු. 3,907,266 ක් බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ දර්ශනය හා මෙහෙවර ඉටු කර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු වුවද, 2013 වර්ෂයෙන් පසු සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වන අතර වාර්ෂික විගණන සැලැස්ම අනුව ප්‍රධාන වතුයායන් 18 ක් හා ප්‍රධාන කාර්යාලයේ අංශ 07 ක් ආවරණය කිරීමට සැලසුම්කර තිබුණද, එකී කාර්යයන් වර්ෂය තුළදී සම්පූර්ණකර නොතිබුණු අතර බදු පදනම මත ලබා දී තිබූ වතු 04 ක ක්ෂේත්‍ර පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කර තිබුණි.

### 4.4 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව මාස 03 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 4.5 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ප්‍රකාරව 2015 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | ලේඛන පවත්වා ගැනීම | මූලාශ්‍ර ලේඛන නිසිපරිදි නඩත්තුකර නොතිබීම. |
| (ආ) | අයවැය පාලනය | අයවැයගත ඉලක්ක සපුරාගැනීම අධික්ෂණය කිරීම පහළ මට්ටමක පවතින අතර, කාර්යසාධනය වර්ධනය කරගැනීමට අදාල තාක්ෂණික මෙවලම් සහ ක්‍රියාවලීන් භාවිතා කර නොතිබීම. |
| (ඇ) | සේවක කළමනාකරණය | අනුමත සේවක සංඛ්‍යාවට අමතරව සේවකයින් බඳවා ගැනීම, නිතීරීතිවලට පටහැනිව උසස් වීම් හා සේවය දීර්ඝ කිරීම් සිදු කර තිබීම සහ සේවකයින්ට නිසිපරිදි වගකීම්, රාජකාරී පවරා නොදීම. |
| (ඈ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන සැලැස්ම අපේක්ෂිත පරිදි ඉටු නොකිරීම. |